# මැතිවරණ කොමිෂන් සභාව
# தேர்தல்கள் ஆணைக்குழு

පොදු කාර්යාලය : **011-2868441, 2868442, 286844**
பொது அலுவலகம்
ෆැක්ස්/தொலைநகல் : **011-2868426**

මැතිවරණ කොමිෂන් සභා කාර්යාලය
සරණ මාවත,රාජගිරිය **(10107)**
**தேர்தல்கள் ஆணைக்குழு அலுவலகம்**
**சரண மாவத்தை, இராஜகிரிய (10107)**

***web : www.slelections.gov.lk e-mail : info@slelections.gov.lk***


| | | |
|---|---|---|
| මගේ අංකය : EC/EDR/LAE/2023/04B<br>எனது இல. | ඔබේ අංකය :<br>உமது இல. | දිනය : 2023.01.<br>திகதி |

**චක්‍රලේඛ අංක 37**

සියළුම නගරාධිපතිවරු/උප නගරාධිපතිවරු/සභාපතිවරු/උප සභාපතිවරු සහ පරිපාලන ප්‍රධානීන් වෙත.

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2023**
**පළාත් පාලන ආයතන සතු රාජ්‍ය දේපළ අවභාවිතාව වැළැක්වීම.**

2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළව රජයට සහ රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩලවලට අයත් දේපළ ඡන්ද විමසීම් කාල සීමාව තුළ දී අනිසි ලෙස භාවිතා කිරීම වැළැක්වීම සහ එකී ආයතනවල නිලධාරීන්, සේවකයන් බඳවා ගැනීම/ උසස් කිරීම/ මාරු කිරීම සීමා කිරීම සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද අංක EC/EDR/LAE/2023/04B හා 2023.01.05 දිනැති චක්‍රලේඛ අංක 20 කෙරෙහි හා ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයේ අංක 2313/32 දරන හා 2023.01.04 දිනැති අති විශෙෂ ගැසට් නිවේදනය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02. එමෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ආ) (4) (අ) ව්‍යවස්ථා අනුව “මැතිවරණයක් පවත්වනු ලබන කාල පරිච්ඡේදය තුළ දී රජයට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට හෝ අයත් යම් නිශ්චල හෝ චංචල දේපළක්” යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තෝරා පත්කර ගැනීම ප්‍රවර්ධනය කිරීමේ හෝ වළක්වාලීමේ කාර්යය සඳහා යම් දේශපාලන පක්ෂයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ විසින් භාවිතා කිරීම තහනම් කිරීමේ බලය මැතිවරණ කොමිෂන් සභාවේ උපදෙස් මත සභාපතිවරයාට හෝ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාට පවතී. එම ව්‍යවස්ථාවේ (ආ) අනු ව්‍යවස්ථාව යටතේ මැතිවරණ කොමිෂන් සභාව විසින් කරනු ලබන එවැනි විධානයකට අනුකූලවීම සහ ක්‍රියාත්මක කිරීම තත් කාලයේ රජය සතු දේපළ භාරව සිටින හෝ පාලනය දරන සියළුම නිලධාරීන් බැඳී සිටී. එවැනි විධානයක් උල්ලංඝනය කිරීම අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබූවිට වසර තුනක සිර දඬුවමක් හෝ රුපියල් ලක්ෂයක දඩයකින් හෝ එකී දඬුවම් ද්විත්වයම ලබාදීමට හැකි වරදක් බව ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ම හඳුන්වා දී ඇති බව ද අවධාරණය කරමි.

03. පළාත් පාලන ආයතන විසුරුවා හැර නොමැති බැවින් මෙම ඡන්ද විමසීමේ දී දැනටත් සභික ධුර දරන මහජන නියෝජිතයන් ද තරග කරනු ඇත. තරග කරනු නොලැබුව ද ඔවුන් තම ධුර හා ආයතනික සම්පත් තම ලැදියාව පවතින දේශපාලන පක්ෂයකට, ස්වාධීන කණ්ඩායමකට හෝ අපේක්ෂකයකු ප්‍රවර්ධනය වන ආකාරයෙන් හෝ වෙනත් දේශපාලන පක්ෂයක්, ස්වාධීන කණ්ඩායමක් හෝ අපේක්ෂකයෙකුට අගතිගාමී වන ලෙස යෙදීමේ ඉඩකඩ පවතී. එබැවින් ඉහත කරුණු කෙරෙහි අවධානය යොමු කර එහි සඳහන් කරුණු තරයේ පිළිපැදීමට ක්‍රියා කරන ලෙස දන්වා සිටින අතර, ඡන්ද විමසීම් කාල සීමාව තුළ කිසිදු පක්ෂ/ අපේක්ෂකයෙකු ප්‍රවර්ධනය පිණිස හෝ අගතියට පත්වන ආකාරයට ක්‍රියාකිරීම හෝ ඒ වෙනුවෙන් ආයතන සතු නිශ්චල හා චංචල දේපළ භාවිතා කිරීමෙන් වැළකීම අත්‍යාවශ්‍ය හෙයින් ඒවායේ වගකීම භාරව සිටින නිලධාරීන් වශයෙන් ඒ පිළිබඳව නිසැක වීම සියළුම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් සහ පරිපාලන නිලධාරීන්ගේ වගකීමක් බව ද දන්වා සිටිනු ලැබේ. එසේම ඒ සම්බන්ධ පැමිණිලි ලදොත් දැඩිව ක්‍රියා කිරීමට පොලීසියට හා අදාළ නිලධාරීන්ට උපදෙස් ලබා දී ඇති බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සඳහා ඔබගෙන් ලැබෙන සහාය බෙහෙවින් අගය කරමි.

නිමල් පුංචිහේවා

නීතිඥ නිමල් ජී පුංචිහේවා
සභාපති
(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙනි)

පිටපත් :
01. පොලිස්පතිතුමා
02. සියළුම තේරීම්භාර නිලධාරීන්
03. දිස්ත්‍රික් නියෝජ්‍ය/ සහකාර මැතිවරණ කොමසාරිස්වරුන්
04. ප්‍රධාන කාර්යාලයේ සියලුම මාණ්ඩලික නිලධාරීන්